සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2023-03-05
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයක් වන්නේ කවුද?

(1) සමාජය. (2) ණයහිමියන්. (3) තරඟකරුවන්. (4) හිමිකරුවන්.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, විධිමත් සංවිධානයක් සඳහා උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

(1) අධ්‍යාපන අමාත්‍යාංශය. (2) සීමාසහිත Google පොදු සමාගම.
(3) මුහුණුපොතේ කථාබස් කණ්ඩායම (chat group). (4) කොළඹ විශ්ව විද්‍යාලය.

**1.3** පහත සඳහන් කාණ්ඩ අතුරෙන්, මිනිස් අවශ්‍යතා පමණක් අඩංගු කාණ්ඩය වන්නේ කුමක් ද?

(1) නිවාස, ආහාර සහ ඇඳුම්. (2) පාන්, ආහාර සහ ආරක්ෂාව.
(3) පාන්, නිවාස සහ කමිස. (4) නිවාස, කමිස සහ විදුලිය.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, විධිමත් ව්‍යාපාරයක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) එයට අඛණ්ඩ ක්‍රියාවලියක් පවතී. (2) එහි අවිනිශ්චිතතාවයක් නොමැත.
(3) එහි ආර්ථික කටයුත්තක් නොමැත. (4) එය ලාභයෙන් අභිප්‍රේරණය නොවේ.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, මුදල් වෙනුවට චෙක්පත් භාවිතයෙන් ඇති වාසියක් වන්නේ කුමක් ද?

(1) ගෙවූ මුදල පිළිබඳ ඔප්පු කිරීම පහසු වීම.
(2) ආරක්ෂාකාරීව ගෙවීම් සිදුකළ හැකි වීම.
(3) ඉදිරි දාතම (post-date) යෙදීමට හැකි වීම.
(4) ඉහත සඳහන් සියල්ලම.

**1.6** කොළඹ කොටස් හුවමාරුව සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** එය ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය කරනු ලබයි.

**(b)** එය ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන ආයතනික සහ තනි ආයෝජකයින් සඳහා නියාමනය කරන ලද පරිසරයක් සපයනු ලැබේ.

**(c)** එය ආයෝජකයින්ගේ කොටස්, මුදල් බවට පරිවර්තනය කිරීමට උපකාරී වේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, කොළඹ කොටස් හුවමාරුව පිළිබඳ නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(b)** පමණි.
(2) **(c)** පමණි.
(3) **(b)** සහ **(c)** පමණි.
(4) **(a)** සහ **(c)** පමණි.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු **නොලබන්නේ** කුමක් ද?

(1) රාජ්‍ය බැංකු.
(2) ඒකක භාර.
(3) බලපත්‍රලාභී වාණිජ බැංකු.
(4) ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාගම්.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, තොග වෙළඳාමේ ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) සැලකිය යුතු ණය ගනුදෙනු ප්‍රමාණයක් ඇතුළත් වීම
(2) ගැනුම්කරුගේ අරමුණ, ස්වයං-පරිභෝජනය සඳහා වීම.
(3) සම්බන්ධිත පාර්ශවයන් වන්නේ සිල්ලර වෙළෙඳුන් සහ පාරිභෝගිකයින්ය.
(4) ගනුදෙනු සෑම විටදීම මුදල් හෝ මුදල්වලට සමාන දෑ වලින් සම්පූර්ණ කිරීම.

**1.9** පහත සඳහන් ලක්ෂණ සලකා බලන්න:

**(a)** දැක්ම (Vision).

**(b)** නිර්මාණශීලීත්වය.

**(c)** ආත්ම විශ්වාසය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකයෙකුගේ ලක්ෂණයක් / ලක්ෂණ වන්නේ:

(1) **(a)** පමණි.
(2) **(b)** සහ **(c)** පමණි.
(3) **(a)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

1.10 පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

(a) රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය සැපයීම.

(b) අඛණ්ඩ පැවැත්මේ අඩුකම.

(c) රැකියා අවස්ථා උත්පාදනය කිරීම.

(d) දිළිඳුභාවය තුරන් කිරීමට උපකාරී වීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ (SMEs) වැදගත්කම පෙන්වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a), (b)** සහ **(c)** පමණි.

(3) **(a), (c)** සහ **(d)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** චෙක්පතක් යනු විද්‍යුත් මුදල් සඳහා උදාහරණයකි.

**1.12** ණයවර ලිපියක් යනු ජාත්‍යන්තර වෙළඳාමේ භාවිත වන ගෙවීම් ක්‍රමයකි.

**1.13** ප්‍රාග්ධන වෙළෙඳපොළ යනු කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා වන වෙළෙඳපළකි.

**1.14** පිටසන ලෙස පැවරුම්ලාභියාගේ නම පමණක් සඳහන් වේ නම්, එය හිස් පිටසනක් ලෙස සැළකේ.

**1.15** හානිපූර්ණ මූලධර්මය, ජීවිත රක්ෂණයට පමණක් සළකා බලයි.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** සංවිධානයක දැක්ම (Vision) සහ මෙහෙවර (Mission) අතර වෙනස සඳහන් කරන්න.

**1.17** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ [Small & Medium Enterprises (SMEs)] කාර්යසාධනය ඉහළ නැංවීමේ ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

**1.18** පෝටර්ගේ පංච බලවේග (Porter's Five Forces) විශ්ලේෂණයේ සඳහන් බලවේග දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** අභ්‍යන්තර ව්‍යවසායකත්වය (Intra-Entrepreneurship) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.20** සාංගමික සමාජයීය වගකීම [Corporate Social Responsibility (CSR)] යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 40)

### **02** වන ප්‍රශ්නය

**ඇන්,** පෞද්ගලික අධ්‍යාපන ආයතනයක ව්‍යාපාර අධ්‍යයන පාඨමාලාවක් හදාරමින් සිටී. විෂය නිර්දේශයේ කොටසක් ලෙස ඇය විසින් ශ්‍රී ලංකාවේ සමාගම් පනත සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා එය අදාල වන ආකාරය පිලිබඳ ඉදිරිපත් කිරීමක් (presentation) කළ යුතුව ඇත. පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සෙවීමට **ඇන්** ඔබේ උපකාරය අපේක්ෂා කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංස්ථාපන සහතිකයේ (Certificate of Incorporation) ඇතුළත් තොරතුරු තුනක්(03) **හඳුනා දක්වන්න**.(ලකුණු 03)

(b) රටක ආර්ථිකයකට සීමාසහිත පොදු සමාගමකින් ඇති වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාවේ සමාගම් පනත අනුව, සමාගමක නම භාවිත කළයුතු ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### **03** වන ප්‍රශ්නය

**Expressway** යනු අධිවේගී මාර්ග බස් රථ, මගී වෑන් රථ, සුඛෝපභෝගී කාර් සහ ලොරි රථ කුලියට දීමේ නියුතු ප්‍රවාහන සේවා සපයන ආයතනයකි. **Expressway** ආයතනයේ හිමිකරු සහ කළමනාකරු **නෙවිල්** මහතා වන අතර, ඔහු සෑම වසරකම සැලකිය යුතු මුදලක් මෙම වාහන රක්ෂණය කිරීම සඳහා වැය කරනු ලබයි. කෙසේවෙතත්, පොදු ප්‍රවාහනයේ පවතින අවධානමට සාපේක්ෂව මෙම පිරිවැය නොසැළකිය හැකි තරම් වන බව ඔහු විශ්වාස කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **නෙවිල්** ට ඔහුගේ වාහන සමූහය රක්ෂණය කළ හැකි රක්ෂණ ඔප්පු වර්ගය කුමක්දැයි යන්න **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) ව්‍යාපාර සංවිධානයකට රක්ෂණය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) සඵලදායී ප්‍රවාහන පද්ධතියක් නොමැතිවීම හේතුවෙන්, ආයතනයකට මුහුණදීමට සිදුවන දුෂ්කරතා හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**E-way** යනු විද්‍යුත් බයිසිකල් සිල්ලර වෙළඳාමේ යෙදී සිටින මැලේසියානු සමාගමක් වේ. ඔවුන් තම නිෂ්පාදන ඔවුන්ගේ වෙබ් අඩවිය වන "www.eway.com" හරහා ප්‍රචාරණය කරනු ලබයි. බයිසිකල් මිලට ගැනීමට අපේක්ෂිත පාරිභෝගිකයින්ට ඔවුන්ගේ වෙබ් අඩවියට පිවිස බයිසිකලයේ මිලෙන් 50% ක් ගෙවා ඇණවුම් සිදුකළ හැක. ඔවුන්ගේ නියෝජිතයන් ආසියානු කලාපයේ රටවල් කිපයක සිටින අතර, පාරිභෝගිකයින් විසින් බයිසිකල් ඇණවුම් කිරීමෙන් පසු **E-way** ආයතනය එම බයිසිකල් අදාල නියෝජිතයන් මාර්ගයෙන් අපනයනය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **E-way** ආයතනය නියැලී සිටින විද්‍යුත් වෙළඳාමේ (electronic trade) වර්ගය **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) පාරිභෝගිකයින්ට විද්‍යුත් වෙළඳාමෙන් ලැබෙන වාසි දෙකක්(02) සහ අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා පහසුකම් සපයන රාජ්‍ය ආයතන දෙකක්(02) **හඳුනා දක්වා** ඒවායේ කාර්යභාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**තරිඳු** මෑතකදී තායිලන්ත රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගන්නා ලදී. උපාධි අපේක්ෂකයෙකු ලෙස සිටින අවධියේදී **තරිඳු** තායිලන්තයේ විවිධ ප්‍රදේශවල සංචාරය කොට තිබූ අතර, එහිදී තායිලන්තයේ පොල් ප්‍රවාහන කටයුතු සඳහා ජල මාර්ග භාවිතයට ගන්නා ආකාරය පිළිබඳ අත්දැකීම් ලබා තිබුණි. පොල් වත්තක උරුමක්කරුවෙකු වන **තරිඳු,** පොල් වතුවල සිට පොල් මෝල් සහ පොල් අමුද්‍රව්‍ය ලෙස භාවිත කරන වෙනත් කර්මාන්ත ශාලා වෙත පොල් ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජල මාර්ග සංවර්ධනය කළ හැකිද යන්න පිළිබඳව සළකා බලමින් සිටී. මේ වන විට ව්‍යවසායකයෙකු ලෙස **තරිඳු,** අපනයන වෙළෙඳපොළ කේන්ද්‍ර කර ගනිමින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ප්‍රවාහන පද්ධතියක් ලෙස හොඳ ජල මාර්ග ප්‍රවාහන පද්ධතියක ගුණාංග තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අපනයනකරුවෙකුට සපයනු ලබන සේවා තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) ව්‍යවසායකත්වය සහ ව්‍යාපාරය අතර පවතින සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**C සොෆ්ට්** යනු වේයන්ගොඩ ඔයට මායිම්ව වේයන්ගොඩ ප්‍රදේශයේ අක්කර 13 ක භූමි භාගයක පිහිටා ඇති සිසිල් බීම නිෂ්පාදන ආයතනයකි. ඔවුන් තම නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය පළතුරු මොණරාගල, ගම්පහ, අනුරාධපුරය සහ වැල්ලවාය යන දිවයිනේ විවිධ ප්‍රදේශවලින් මිලදී ගනු ලබයි. ඉහත සඳහන් ප්‍රදේශවල සිටින සුළු පරිමාණ ගොවියන් සමඟ සමාගම හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි. **C සොෆ්ට්** ආයතනය යම් නිශ්චිත සතියක් සඳහා අවශ්‍යවන පළතුරු ප්‍රමාණය දැක්වීම සඳහා පරිගණක යෙදවුමක් නිපදවා ඇත. **C සොෆ්ට්** ආයතනය සමඟ ලියාපදිංචි වී ඇති කුඩා පරිමාණ ගොවියන් හට ඔවුන්ගේ ජංගම දුරකතනය හරහා මෙම පද්ධතියට ප්‍රවේශ විය හැකි අතර, ඔවුන් විසින් ඔවුන් සතුව පවත්නා පළතුරු තොග පිළිබඳව මෙම පද්ධතිය යාවත්කාලීන කරනු ලැබේ. **C සොෆ්ට්** ආයතනයේ පද්ධතිය මඟින් අදාල ගොවීන් වෙත ස්වයංක්‍රීයවම ඇණවුම් ලබාදෙනු ලබන අතර, පළතුරු වේයන්ගොඩ පිහිටි කර්මාන්තශාලාවට ප්‍රවාහනය කෙරේ.

නිෂ්පාදන කම්හලෙහි අපජලය කිසිදු පවිත්‍ර කිරීමකින් තොරව බැහැර කරන බවට ප්‍රදේශය පුරා පැතිර ගිය කටකතා හේතුවෙන් මෙම වසර තුළ ඔවුන්ට ගැටලු රුසකට මුහුණ දීමට සිදුවිය. මෙම අපජලය හේතුවෙන් තම නිවෙස්වල ළිං ඇතුළු ජල මූලාශ්‍ර තර්ජනයට ලක්ව ඇතැයි ගම්මුන් සැක පළකරන ලදී. වරක් ගම්වාසීන් සමූහයක් විසින් **C සොෆ්ට්** ආයතනය පරිසර දූෂණය කරන බවට චෝදනා කරමින් ආයතනයේ ප්‍රධාන පිවිසුම ඉදිරිපිට විරෝධතාවයක් සංවිධානය කරන ලදී. මෙම විරෝධතාවය පොලිසියේ මැදිහත් වීමෙන් සමථයකට පත්වූ අතර, එම සතියේ පළවන ජාතික පුවත්පතක් මෙම සිදුවීම පිළිබඳව ලිපියක් ප්‍රසිද්ධ කරනු ලැබිය. තවද, එම පුවත්පත විසින්ම **C සොෆ්ට්** ආයතනයේ සමහර නිෂ්පාදිත සඳහා කෘත්‍රිම වර්ණක සහ රසකාරක භාවිත කරන බව පෙන්වා දෙන ලදී. පසුව, **C සොෆ්ට්** ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පවත්වනු ලැබූ මාධ්‍ය හමුවකදී, ආයතනය විසින් අදාල පරිසර සහතික, ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය (SLS) සහ ජාත්‍යන්තර ප්‍රමිත සහතිකය (ISO) ලබාගැනීම සහ අපජලය පිරිසිදු කිරීමේ පවිත්‍රාගාරයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳ දැනුවත් කරන ලදී. තවද, ආයතනය විසින් ගම්වාසීන්ගේ නියෝජිතයන් පිරිසකට කර්මාන්තශාලාවේ කටයුතු දැක බලා ගැනීමටත්, කටකතාවලට වඩා දැක බලාගත් තොරතුරු මත විශ්වාසය තබන ලෙසත් ඉල්ලීමක් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **C සොෆ්ට්** ආයතනය තම ව්‍යාපාරික කටයුතු ආචාරධර්මවලට අනුකූලව පවත්වාගෙන යාම සඳහා සළකා බැලිය යුතු සාධක තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) **C සොෆ්ට්** ආයතනයේ ව්‍යාපාර කටයුතු සඳහා නව තාක්ෂණය භාවිත කිරීමේ වාසි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(c) පරිසර දූෂණය වැළැක්වීම සඳහා **C සොෆ්ට්** ආයතනයට ගතහැකි ක්‍රියාමාර්ග හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(d) ඉහත සිද්ධියට අනුව දැනට **C සොෆ්ට්** ආයතනය සතුව ඇති ආර්ථික සම්පත් තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(e) "සමාජය" (society), **C සොෆ්ට්** ආයතනයේ ඉතා වැදගත් ඇල්මැතිපාර්ශවයක් වන්නේ ඇයිදැයි යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |